68. **බුද්ධසාසනපාලෙතා;** බුදුසසුන පාලනය කරන, **පුත්ත;** පුත්‍රයාණෙනි, **තව;** ඔබගේ, **පච්ඡිම;** අවසාන, **දස්සනං;** දැකීම යි, **යත්ථ;** යම්තැනක, **ගතො;** ගියේ, **න දිස්සතෙ;** නො දක්නා ලැබේ ද, **අහං;** මම, **තත්ථ;** එහි, **ගච්ඡාමි;** යමි.

69. **කදාචි;** කිසියම් දිනක, **ලොකග්ගනායකො;** ලොකාග්‍ර වූ නායකයන් වහන්සේ, **ධම්මං දෙසෙන්තො;** ධර්මය දේශනා කරමින්, **බ්පි,** කිව්සි සේක් ද, **තදා;** එවිට, **අහං;** මම, **අනුකම්පිකා;** අනුකම්පා ඇත්තී, **ආසිංසවචං;** ආශීර්වාද වචනයක්, **අවොචං;** කීවෙමි.

70. **මහාවීර;** මහාවීරයන් වහන්ස, **චිරං ජීව;** බොහෝ කල් ජීවත්වන සේක්වා, **මහාමුනෙ;** මහා මුනිවරයාණෙනි, **කප්පං;** කල්පයක්, **තිට්ඨ;** වැඩ සිටින්න, **සබ්බලොකස්ස;** සියලු ලෝකයාට, **අත්ථාය;** වැඩ පිණිස, **අජරාමරො;** අජරාමර, **භවස්සු;** වන සේක්වා.

71. **තථාවාදිනිං;** එසේ කියන්නාවූ, **තං මමං;** ඒ මට, **සො බුද්ධො;** ඒ බුදුන්වහන්සේ, **එතං;** මෙය, **අබ්‍රවී;** කී සේක, **ගොතමී;** ගෝතමිය, **යථා වන්දසි;** ඔබ යම් අයුරකින් වඳිහි ද, **බුද්ධා;** බුදුවරු, **එවං නහි වන්දියා;** මෙසේ නොවැන්ද යුත්තාහ.

72. **සබ්බඤ්ඤු;** සර්වඥයන් වහන්ස, **චරහි;** එසේ නම්, **තථාගතා;** තථාගතයන් වහන්සේලා, **කථං;** කවර අයුරකින්, **වන්දිතබ්බා;** වැන්ද යුත්තාහු ද, **බුද්ධා;** බුදුවරු, **කථං;** කවර අයුරකින්, **අවන්දියා;** නො වැන්ද යුත්තාහු ද, **පුච්ඡිතො;** විමසන ලද, **මෙ;** මට, **අක්ඛාහි;** කියනු මැනවි.

73. **ආරද්ධවිරියෙ;** පටන්ගන්නා ලද වීර්ය ඇති, **පහිතත්තෙ;** නිවන් පිණිස යොමු කළ සිත් ඇති, **නිච්චං;** නිරතුරු, **දළ්හපරක්කමෙ;** දැඩි උත්සාහ ඇති, **සමග්ගෙ,** සමගිව සිටිනා, **සාවකෙ;** ශ්‍රාවකයන්, **පස්සෙ;** දක්නේ නම්, **එසා;** මෙය, **බුද්ධාභිවන්දනා;** බුදුරදුන්ට කරන වන්දනාව වෙයි.

74. **තතො;** ඉක්බිති, **උපස්සයං;** මෙහෙණවරට, **ගන්ත්වා;** ගොස්, **එකිකා අහං;** එකලා වූ මම, **විචින්තයිං;** සිතුවෙමි, **තිභවන්තගො;** ත්‍රිවිධ භවයන්හි අන්තයට ගිය, **නාථො;** නාථයන් වහන්සේ; **සමග්ගං;** සමගි වූ, **පරිසං;** පිරිස, **රොචෙති;** රුචි කරති.

75. **හන්ද;** ඒකාන්තයෙන්, **අහං;** මම, **පරිනිබ්බිස්සං;** පිරිනිවන් පාන්නෙමි, **තං;** එය, **විපත්තිං;** විපත්තියක් ලෙස, **මා අද්දසං;** නො දිටිමි, **අහං;** මම, **එවං;** මෙසේ, **චින්තයිත්වා;** සිතා, **ඉසිසත්තමං;** බුදුන් වහන්සේ, **දිස්වාන;** දැක,

76. **විනායකං;** ශ්‍රේෂ්ඨ නායකයන් වහ්නසේට, **මෙ;** මාගේ, **පරිනිබ්බානකාලං;** පිරිනිවන් පානා කාලය, **ආරොචෙසිං;** සැළකළෙමි, **තතො;** ඉක්බිති, **සො;** ඒ බුදුන් වහන්සේ, **ගොතමී;** ගෝතමිය, **කාලං ජානාහි;** කල් දනුවයි, **සමනුඤ්ඤාසි;** අනුදත්හ.

77. **මයහං;** මවිසින්, **කිලෙසා;** ක්ලේශයෝ, **ඣාපිතා;** දවන ලදහ, **සබ්බෙ භවා;** සියලු භවයෝ, **සමූහතා;** මුලිනුපුටා දමන ලදහ, **බන්ධනං ඡෙත්වා;** බැඳුම් බිඳ හැසිරෙන, **නාගී ඉව;** ඇත් රැජිනියක මෙන්, **අනාසවා;** ආශ්‍රව රහිතව, **විහරාමි;** වාසය කරමි.

78. **වත;** ඒකාන්තයෙන්, **බුද්ධසෙට්ඨස්ස;** ශ්‍රේෂ්ඨ බුදුන් වහන්සේගේ, **සන්තිකෙ;** සමීපයේ, **මෙ;** මට, **සවාගතං ආසි;** යහපතක් වීය, **තිස්සො විජ්ජා;** ත්‍රිවිද්‍යාවෝ, **අනුප්පත්තා;** ලබන ලදහ, **බුද්ධස්ස සාසනං;** බුදුන්ගේ අනුසාසනාව, **කතං;** කරන ලදී.

79. **චතස්සො පටිසම්භිදා ච;** සිවු පිළිසිඹියා ද, **ඉමෙ අට්ඨ විමොක්ඛා ච;** මේ අෂ්ටවිමෝක්ෂ ද, **ඡළභිඤ්ඤා;** ෂඩ් අභිඥාවන් ද, **සච්ඡිකතා;** සාක්ෂාත් කරන ලදී, **බුද්ධස්ස සාසනං;** බුදුන්ගේ අනුශාසනාව, **කතං;** කරන ලදී.

80. **ගොතමී;** ගෝතමිය, **ථීනං;** ස්ත්‍රීන්ගේ, **ධම්මාභිසමයෙ;** ධර්මාවබෝධයේ දී, **යෙ බාලා;** යම් අඥාන කෙනෙක්, **විමතිං;** වැරදි මතයකට, **ගතා;** ගියාහු ද?, **තෙසං;** ඔවුන්ගේ, **දිට්ඨිපහානත්ථං;** දෘෂ්ටිප්‍රහාණය පිණිස **ඉද්ධිං දස්සෙහි;** සෘද්ධි දක්වන්න.

81. **තදා;** එකල්හි, **ගොතමී;** ගෝතමී තෙරණිය, **සම්බුද්ධං;** බුදුන් වහන්සේට, **නිපච්ච;** වැඳ, **අම්බරං;** අහසට, **උප්පතිත්වාන;** පැන නැඟී, **බුද්ධානුඤ්ඤාය;** බුදුන්ගේ අනුදැනුමෙන්, **අනෙකා ඉද්ධී;** නොයෙක් සෘද්ධීන්, **දස්සෙසි;** දැක්වූවා ය.

82. **එකිකා;** එක ම තැනැත්තිය, **බහුධා ආසි;** බොහෝ ආකාර වූවා ය, **බහුකා ච;** බොහෝ අය ද, **එකිකා ආසි;** එකියක්ව (එක් තැනැත්තියක්ව) වූවා ය, **තථා;** එසේ ම, **ආවීභාවං;** ප්‍රකට බවට ද, **තිරොභාවං;** අප්‍රකට බවට ද, **තිරොකුඩ්ඩං;** පවුර හරහා ද, **තිරොනගං;** පර්වතය හරහා ද.

83. **අසජ්ජමානා;** නොගැවෙමින්, **අගමා;** ගියා ය, **භූමියං අපි;** පොළොවෙහි ද, **නිමුජ්ජථ;** ගැලුණාය, **යථා මහියා;** පොළොවෙහි මෙන්, **අභිජ්ජමානෙ උදකෙ;** නොබිඳෙන ජලයේ, **අගඤ්ඡි;** ගියා ය.

84. **තදා;** එකල, **සකුණී ඉව;** කිරිල්ලියක මෙන්, **ආකාසෙ;** අහසෙහි, **පල්ලඞ්කෙන;** පළඟින් **ගමි;** ගියා ය, **යාව බ්‍රහ්මනිවෙසනං;** බඹලොව දක්වා, **කායෙන;** කයින්, **වසං වත්තසි;** වසඟයෙහි පැවැත්වූවා ය.

85. **සිනෙරුං;** මහාමේරු පර්වතය, **දණ්ඩං කත්වාන;** කුඩමිටක් කොට, **මහාමහිං;** මහපොළොව, **ඡත්තං කත්වා;** කුඩයක් කොට, **සමූලං පරිවත්තෙත්වා;** සහමුලින් ම පෙරළා, **ධාරෙන්තී;** දරමින්; **නභෙ;** අහසෙහි, **චඞ්කමි;** හැසිරුණෙමි.

86. **ඡස්සූරියොදය කාලෙ ඉව;** හිරු හයක් උදාවන කාලයක මෙන්, **ලොකං ච;** ලොව ද, **ධූමිකං අකාසි;** දුම් සහිත වූවක් කළා ය, **සා;** ඕ තොමෝ, **ලොකං;** ලෝකය, **යුගන්තෙ විය;** කල්පාන්තයේ මෙන්, **ජාලාමාලාකුලං;** ගිනිදැල්වලින් ගැවසීගත්තක්, **අකා;** කළා ය.

87. **මුචලින්දං මහාසෙලං;** මුචලින්ද මහා පර්වතය, **මෙරු මන්දාර දද්දරෙ;** මේරු මන්දාර දද්දර යන පර්වත , **සබ්බානි;** සියල්ල, **සාසපෙ ඉව;** අබඇට මෙන්, **එකෙන මුට්ඨිනා;** එකමිටට, **අග්ගහි;** ගත්තා ය.

88. **සනිසාකරං;** සඳ සහිතවූ, **භාකරං;** හිරු, **අඞ්ගුලග්ගෙන;** ඇඟිලිතුඩින්, **ඣාදෙසි;** වැසුවා ය, **චන්දසූරසහස්සානි;** දහස්ගණනක් සඳහිරු, **ආවෙලම්ව;** මුදුන්මල්කඩ සෙයින්, **ධාරයී;** දැරුවා ය.

89. **චතුසාගරතොයානි;** සිවුසයුරෙහි දිය, **එකපාණිනා;** එක අල්ලෙන්, **ධාරයී;** දැරුවා ය, **යුගන්තජලදාකරං;** යුගාන්තයෙහි මහා මේඝයක් බඳු, **මහාවස්සං;** මහවැසි, **පවස්සයී;** වැස්ස වූවා ය.

90. **සා;** ඈ, **නභත්ථලෙ;** අහස්තලයෙහි; **සපරිසං;** පිරිස් සහිත, **චක්කවත්තිං;** සක්විති රජෙකු, **මාපයී;** මැව්වා ය, **ගරුළං;** ගුරුළෙකු, **ද්විරදං;** ඇතෙකු, **විනදන්තං;** නාද කරන, **සීහං;** සිංහයෙකු, **දස්සෙසි;** දැක්වූවා ය.

91. **එකිකා;** එකලාව, **අප්පමෙය්‍ය;** අප්‍රමාණ, **භික්ඛුනීගණං;** භික්ෂුණී සමූහයා, **අභිනිම්මිනිත්වා;** මවා, **පුන;** නැවත, **අන්තරධායෙත්වා;** අතුරුදහන් කොට, **එකිකා;** තනිව, **මුනිං;** බුදුන් වහන්සේට, **අබ්‍රවී;** කීවා ය.

92. **මහාවීර;** මහාවීරයන් වහන්ස, **තව;** ඔබගේ, **සාසනකාරිකා;** අනුසාසනාව කරන, **තෙ;** ඔබගේ, **මාතුච්ඡා;** සුළුමව යි. **චක්ඛුම;** ඇස් ඇත්තාණෙනි, **සකං අත්ථං;** ස්වාර්ථයට (ලෝකෝත්තර අර්ථයට), **අනුප්පත්තා;** පැමිණි තැනැත්තී, **පාදෙ;** පාදයන්, **වන්දති;** වඳියි.

93. **සා;** ඕතොමෝ, **විවිධා ඉද්ධී;** නොයෙක් ඍද්ධි, **දස්සෙත්වා;** දක්වා, **නභත්ථලා;** අහස්තලයෙන්, **ඔරොහිත්වා;** බැස, **ලොකපජ්ජොතං;** බුදුන් වහන්සේ, **වන්දිත්වා;** වැඳ, **එකමන්තං;** එතක්පසක, **නිසීදි;** හුන්නා ය.

94. **මහාමුනෙ;** මහමුනිවරයාණෙනි, **සා අහං;** ඒ මම, **ජතියා;** උපතින්, **වීසංවස්සසතිකා;** එක් සිය විසි වස් හැවිරිදි වෙමි, **වීර;** වීරයාණෙනි, **එත්තාවතා අලං;** මෙපමණකින් සෑහෙමි, **නායක;** නායකයාණෙනි, **නිබ්බායිස්සාමි;** පිරිනිවන් පාන්නෙමි.

95. **තදා;** එකල, **අතිවිම්හිතා;** අතිශයින් විස්මයට පැමිණි, **සා සබ්බා පරිසා;** ඒ සියලු පිරිස, **කතඤ්ජලී;** කරන ලද ඇඳිලි වැදීම් අත්තේ, **අවොච;** කීවා ය, **අය්‍යෙ;** ආර්යාවෙනි, **කථං;** කෙසේ, **අතුල;** අසමාන, **ඉද්ධිපරක්කමා;** ඍද්ධි පරාක්‍රම ඇත්තියක්, **ආසි;** වූවා ද?

96. **සබ්බධම්මෙසු;** සියලු ධර්මයන්හි, **චක්ඛුමා;** ඇස් ඇති, **නායකො;** නායකවූ, **පදුමුත්තරො නාම ජිනො;** පදුමුත්තර නම් බුදුන් වහන්සේ, **ඉතො;** මෙයින්, **සතසහස්සම්හි කප්පෙ;** කල්ප ලක්ෂයකට පෙර, **ලොකෙ;** ලොව, **උප්පජ්ජි;** උපන් සේක.

97. **තදා;** එකල, **අහං;** මම, **හංසවතියං;** හංසවතී නගරයෙහි, **සබ්බූපකාරසම්පන්නෙන;** සියලු උපකරණයන්ගෙන් යුතු, **ඉද්ධෙ;** සමෘද්ධිමත්, **ඵීතෙ;** සර්වසම්පූර්ණ, **මහද්ධනෙ;** මහත් ධනය ඇති, **අමච්චකුලෙ;** ඇමති කුලයක, **ජාතා;** උපන්නෙමි.

98. **කදාචි;** කිසිවිටෙක, **දාසීගණපුරක්ඛතා;** දාසිසමූහයා විසින් පෙරටු කරන ලද්දී, **මහතා පරිවාරෙන;** මහත් පිරිවරින්; **පිතුනා සද්ධිං;** පියා සමග, **තං;** ඒ, **නරාසභං;** බුදුරදුන් වෙත, **උපෙච්ච;** එළඹ...

99. **වාසවං විය;** ශක්‍රදේවේන්‍ද්‍රයා වැනි, **අනාසවං;** කෙලෙස් රහිත, **ධම්මමෙඝං;** දහම් නමැති මේඝය, **වස්සෙන්තං;** වස්වන, **සරදාදිච්ච සදිසං;** සරත් කාලයෙහි හිරු හා සමාන වූ, **රංසිමාලාකුලං;** රැස්මාලා වලින් ගැවසී ගත්, **ජිනං;** බුදුන් වහන්සේ ...

100. **දිස්වා;** දැක, **චිත්තං;** සිත, **පසාදෙත්වා;** පහදවා, **අස්ස;** උන්වහන්සේගේ, **සුභාසිතං ච;** සුභාෂිතය ද, **සුත්වා.** අසා, **නරනායකං;** නරශ්‍රේෂ්ඨයන් වහන්සේ, **මාතුච්ඡං;** (සිය) සුළුමව වූ, **භික්ඛුනිං;** භික්ෂුණිය, **අග්ගෙ ඨපෙන්තං;** අග තනතුරෙහි තබනු ...

101. **සුත්වා;** අසා, **සත්තාහං;** දින හතක්, **සසඞ්ඝස්ස;** සංඝයා සහිත, **තාදිනො;** තාදී ගුණ ඇති **තස්ස නරග්ගස්ස;** ඒ නර ශ්‍රේෂ්ඨයන් වහන්සේට, **මහාදානං;** මහාදානයක් ද, **බහූනි පච්චයානි ච;** බොහෝ ප්‍රත්‍යයන් ද,  **දත්වා;** දී ...

102. **පාදමූලම්හි නිපජ්ජ;** පාමුල වැටී, **තං ඨානං;** ඒ තනතුර, **අභිපත්ථයිං;** ප්‍රාර්ථනා කළෙමි, **තතො;** ඉක්බිති, **ඉසිසත්තමො;** ඍෂි ශ්‍රේෂ්ඨයන් වහන්සේ, **මහාපරිසතිං;** මහපිරිස් මැද, **අවොච;** වදාළ සේක.

103. **යා;** යම් කාන්තාවක්, **සසඞ්ඝං;** සංඝයා සහිත, **ලොකනායකං;** ලෝකනායකයන් වහන්සේ, **සත්තාහං;** සත්දිනක්, **අභෙ ජෙසි;** වැළඳ වූවා ද, **අහං;** මම, **තං;** ඇය, **කිත්තයිස්සාමි;** ප්‍රශංසා කරන්නෙමි, **භාසතො;** කියන්නා වූ, **මම;** මාගේ වචනය,  **සුණාථ;** අසවු.

104. **ඉතො;** මෙයින්, **සතසහස්සෙ කප්පෙ;** කල්පලක්‍ෂයක් මත්තෙහිදී, **ඔක්කාකකුලසම්භවො;** ඔක්කාක කුලයේ උපන්, **ගොත්තෙන;** ගෝත්‍රයෙන්, **ගොතමො නාම;** ගෝතම නම් වූ, **සත්ථා;** ශාස්තෘන් වහන්සේ, **ලොකෙ;** ලොව, **භවිස්සති;** පහළ වන්නේ ය.

105. **තස්ස;** උන්වහන්සේගේ, **ධම්මෙසු දායාදා;** ධර්මය දායාද වූ, **ඔරසා;** ඖරස වූ, **ධම්මනිම්මිතා;** ධර්මයෙන් නිර්මිත වූ, **නාමෙන;** නමින්, **ගොතමී නාම;** ගෝතමී නම් වූ, **සත්ථුසාවිකා;** බුද්ධ ශ්‍රාවිකාවක්, **හෙස්සති;** වන්නී ය.

106. **තස්ස බුද්ධස්ස;** ඒ බුදුරදුන්ගේ, **ජීවිත ආපාදිකා;** ජීවිතය වඩාලන, **මාතුච්ඡා;** සුළුමව වූ, **අයං;** මෝ තොමෝ, **රත්තඤ්ඤූනං, භික්ඛුනීනංච;** චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර ද, **අග්ගත්තං;** අගතනතුර, **ලභිස්සති;** ලබන්නී ය.

107. **තං සුත්වාන;** ඒ අසා, **පමුදිතා;** සතුටු වූ, **අහං;** මම, **තදා;** එකල, **යාවජීවං;** දිවි ඇතිතාක්, **ජිනං;** බුදුන් වහන්සේට, **පච්චයෙහි;** සිව්පසයෙන්, **උපට්ඨිත්වා;** උපස්ථාන කොට, **තතො;** එතනින්, **කාලකතා;** කලුරිය කළෙමි.

108. **සබ්බකාමසමිද්ධිසු;** සියලු කාමයෙන් සමෘද්ධ වූ, **තාවතිංසෙසු දෙවෙසු;** තවුතිසා දෙවියන් අතර, **නිබ්බත්තා;** උපන්, **අහං;** මම, **දසහි අඞ්ගෙහි;** දස කරුණෙකින්, **අඤ්ඤෙ;** සෙසු දෙවියන්, **අභිභවිං;** ඉක්මවා සිටියෙමි.

109. **රූපසද්දෙහි;** රූපයෙන් හා ශබ්දයෙන් ද, **ගන්ධෙහි;** ගන්ධයෙන් ද, **රසෙහි;** රසයෙන් ද, **ඵුසනෙහි ච;** ස්පර්ශයෙන් ද, **ආයුනා අපි;** ආයුෂයෙන් ද, **වණ්ණෙන;** වර්ණයෙන් ද, **සුඛෙන ච;** සැපයෙන් ද, **යසසා අපි;** කීර්තියෙන් ද,

110. **තථා එව;** එසේ ම, **ආධිපතෙ යෙන;** අධිපතිභාවයෙන් ද, **අධිගය්හ;** (සෙසු දෙවියන්) අභිභවා, **අහං;** මම, **විරොචිං;** බැබළුනෙමි, **තහිං;** එහි, **අමරින්දස්ස;** දෙව්රජුගේ, **දයිතා;** ප්‍රේමණීය, **මහෙසී;** මෙහෙසිය, **අහොසිං;** වීමි.

111. **සංසාරෙ;** සසර, **සංසරන්තී;** හැසිරෙන, **අහං;** මම, **කම්මවායුසමෙරිතා;** කර්මවායුවෙන් මෙහෙයන ලද්දී, **කාසිස්ස රඤ්ඤො;** කාසිරජුගේ, **විසයෙ;** විජිතයෙහි, **දාසගාමකෙ;** දාසයන්ගේ ගමක, **අජායිං;** උපන්නෙමි.

112. **තදා;** එකල, **තහිං;** එහි, **අනූනා;** නොඅඩුව, **පඤ්චදාසසතා;** පන්සියයක් දාසයෝ, **නිවසන්ති;** වාසය කරති, **අහං;** මම, **තත්ථ;** එහි; **සබ්බෙසං;** සියල්ලන්ට, **යො;** යමෙක්, **ජෙට්ඨො;** ජ්‍යෙෂ්ඨ ද, **තස්ස;** ඔහුගේ, **ජායා;** භාර්යාව, **අහොසිං;** වීමි.

113. **පඤ්චසතා සයම්භුනො;** පන්සියයක් පසේ බුදුවරු, **ගාමං;** ගමට, **පිණ්ඩාය;** පිඬු පිණිස, **පාවිසුං;** පිවිසියහ, **අහං;** මම, **තෙ;** ඔවුන්, **දිස්වාන;** දැක, **තුට්ඨා;** සතුටට පත්වූවා, **සබ්බෙහි ඤාතීහි සහ;** සියලු නෑයන් සමග ...

114. **පඤ්චසතකුටී;** පන්සියයක් කුටි, **කත්වා;** කොට, **චතුමාසෙ;** මාස හතරක් උපට්ඨිය උපස්ථාන කොට, **තිචීවරානි දත්වාන;** තුන්සිවුරු දී, **සසාමිකා;** ස්වාමිවරුන් සමග, **පසන්නා අම්හ;** ප්‍රසන්න වූවෙමු.

115. **සපතිකා;** සැමියන් සහිත, **මයං;** අපි, **තතො චුතා;** එයින් චුතව, **තාවතිංසගතා;** තව්තිසාවට ගියෙමු, **ඉදානි;** දැන්, **පච්ඡිමෙ භවෙ;** අවසන් භවයෙහි දී, **දෙවදහෙ පුරෙ;** දෙව්දහනුවර, **ජාතා;** උපන්නෝ වෙමු.

116. **මෙ;** මාගේ, **පිතා;** පියතෙම, **අඤ්ජනසක්කො;** අංජන ශාක්‍ය රජු ය, **මම මාතා;** මාගේ මව, **සුලක්ඛණා;** සුලක්ෂණා දේවිය යි, **තතො;** ඒ දෙව්දහ නුවරින්, **සුද්ධොදනඝරං;** සුද්ධෝදන රජුගේ ගෙට, **ගතා;** ගියෙමි.

117. **සක්‍යකුලෙ ජාතා;** ශාක්‍යකුලයෙහි උපන්, **සෙසා;** සෙසු අය, **සක්‍යානං;** ශාක්‍ය රජුන්ගේ, **සරං,** ගෙට, **ආගමුං;** පැමිණියාහුය, **සබ්බාසං;** සියල්ලන් අතුරෙන්, **විසිට්ඨා;** විශිෂ්ට වූ, **අහං;** මම, **ජිනස්ස;** බුදුරජුන්ගේ, **ආපාදිකා;** පෝෂක මව, **අහුං;** වීමි.

118. **මම පුත්තො;** මාගේ පුතා, **අභිනික්ඛම්ම;** අභිනිෂ්ක්‍රමණය කොට, **විනායකො;** තමාට නායකයෙකු නැති, **බුද්ධො ආසි;** බුදුවීය, **පච්ඡා;** පසුව, **අහං;** මම, **පබ්බජිත්වා;** පැවිදි වී, **පඤ්චහි සතෙහි සහ;** පන්සියයක් වූ,

119. **ධීරාහි;** ධෛර්ය සම්පන්න, **සාකියානීහි සහ;** ශාක්‍යකුමරියන් හා, **සන්තිසුඛං;** නිවන්සුව, **ඵුසිං;** ස්පර්ශ කළෙමි, **යෙ;** යම් කෙනෙක්, **තදා පුබ්බජාතියං;** එකල්හි පෙර භවයෙහි, **අම්හාකං;** අපගේ, **සාමිනො අහු;** ස්වාමිවරු වූවාහු ද?

120. **සහපුඤ්ඤස්ස කත්තාරො;** එක්ව පින් කළා වූ, **මහාසමයකාරකා;** මහාසමයකාරක වූ, **තෙ;** ඔවුහු (දැන්), **සුගතෙන;** බුදුන් වහන්සේ විසින්, **අනුකම්පිතා;** අනුකම්පා කරන ලද්දාහු, **අරහත්තං;** රහත්බව, **ඵුසිංසු;** ස්පර්ශ කළාහු ය.

121. **තදා;** එකල, **ඉතරා භික්ඛුනියො;** සෙසු භික්ෂුණීහු, **නභත්ථලං;** අහස්තලයට, **ආරුහිංසු;** නැංගාහ, **මහිද්ධිකා;** මහත් ඍද්ධි ඇති ඔවුහු; **තාරායො;** තරු, **සඞ්ඝතා විය;** එක්රැස් වූවාක් මෙන්, **විරොචිංසු;** බැබලුණාහ.

122. **අනෙකා ඉද්ධි;** නොයෙක් ඍද්ධි, **දස්සෙසුං;** දැක්වූහ, **සුසික්ඛිතො;** මනාව ඉගෙනගත්, **කම්මාරො;** රන්කරුවෙක්, **කම්මඤ්ඤස්ස කනකස්ස එව;** වැඩට යෝග්‍ය වූ ස්වර්ණයකින්, **යථා පිළන්ධවිකතී;** බොහෝ රන් ආභරණ කරන්නාක් මෙන්,

123. **බහූනි;** බොහෝ, **විචිත්තානි;** විසිතුරු වූ, **පාටිහීරානි;** පෙළහර, **දස්සෙත්වා;** දක්වා, **තදා;** එදිනට, **සපරිසං;** පිරිසක් සහිත, **වාදිපවරං;** උතුම් වදන් ඇති, **මුනිං;** මුනීන්ද්‍රයන් වහන්සේ, **තොසෙත්වා;** සතුටු කොට,

124. **ගගනා;** අහසින්, **ඔරොහිත්වාන;** බැස, **ඉසිසත්තමං;** උත්තම ඍෂි වූ බුදුරදුන්, **වන්දිත්වා;** වැඳ, **නරග්ගෙන;** නරශ්‍රේෂ්ඨ බුදුන් විසින්, **අනුඤ්ඤාතා;** අනුදන්නා ලද්දාහු, **යථාඨානෙ;** සුදුසු තන්හි, **නිසීදිංසු;** හුන්නාහු ය.

125. **වීර;** වීරයන් වහන්ස, **අහො;** පුදුමයි, **ගොතමී;** ගෝතමී තොමෝ, **අම්හං සබ්බාසං;** අප සියල්ලන්ට ම, **අනුකම්පිකා;** අනුකම්පා ඇත්තී ය, **තව පුඤ්ඤෙහි;** ඔබ වහන්සේගේ කුශලයන් විසින්, **වාසිතා;** සුවඳවත් කරන ලද, **නො;** අප, **ආසවක්ඛයං;** නිවනට, **පත්තා;** පැමිණියෙමු.

126. **අම්හං;** අප විසින්, **කිලෙසා;** කෙලෙස්හු, **ඣාපිතා;** දවන ලදහ, **සබ්බෙ භවා;** සියලු භවයෝ, **සමූහතා;** මුලිනුපුටන ලදහ, **බන්ධනං ඡෙත්වා;** බැඳුම් සිඳ හැසිරෙන, **නාගී ඉව;** හස්තිරාජිනීන් සේ, **අනාසවා;** කෙලෙස් රහිතව, **විහරාම;** වාසය කරමු.

127. **බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ;** ශ්‍රේෂ්ඨ බුදුන් වහන්සේ සමීපයේ, **නො;** අපට, **වත;** ඒකාන්තයෙන්, **ස්වාගතං;** යහපත් පැමිණීමක්ම, **ආසි;** වීය, **තිස්සො විජ්ජා;** ත්‍රිවිද්‍යාව, **අනුප්පත්තා;** උපදවන ලදී, **බුද්ධස්ස සාසනං;** බුදුන්ගේ අනුසාසනාව, **කතං;** කරන ලදී.

128. **ඉමෙ;** මේ, **චතස්සො පටිසම්භිදා ච;** සිවුපිළිසිඹියාවන් ද, **අට්ඨවිමොක්ඛාපි ච;** අෂ්ටවිමෝක්ෂයන් ද, **ඡළභිඤ්ඤා ච,** ෂට් අභිඥාවන් ද, **සච්ඡිකතා;** සාක්ෂාත් කරන ලදී, **බුද්ධසාසනං;** බුදුරදුන්ගේ අනුශාසනාව, **කතං;** කරන ලදී.

129. **මහාමුනෙ;** මහමුනි උතුමාණනි, **ඉද්ධීසු ච;** ඍද්ධීන්හි, **වසී හොම;** වසඟ වූවෝ වෙමු, **දිබ්බාය සොතධාතුයා;** දිවකන්හි ද, **චෙතොපරියඤ්ඤාණස්ස ච;** පරසිත් දන්නා නුවණෙහි ද, **වසීහොම;** වසඟ වූවෝ වෙමු.

130. **පුබ්බෙනිවාසං;** පෙරවිසූ කඳපිළිවෙළ, **ජානාම;** දනිමු, **දිබ්බචක්ඛු;** දිවැස, **විසොධිතං;** පිරිසිදු කරන ලදී, **සබ්බාසවා;** සියලු ආශ්‍රව, **පරික්ඛීණා;** ගෙවී ගියේ ය, **ඉදානි;** දැන්, **පුනබ්භවො;** පුනර්භවයක්, **නත්ථි;** නැත.

131. **මහාවීර;** මහාවීරයන් වහන්ස, **අත්ථෙ ච;** අර්ථයෙහි ද, **ධම්මෙ ච;** ධර්මයෙහි ද, **නෙරුත්තෙ ච;** නිරුක්තියෙහි ද, **පටිභානෙ ච;** ප්‍රතිභානයෙහි ද, **අම්හං;** අපට, **ඤාණං විජ්ජති;** යම් ඥානයක් වෙයි ද, (එය) **තව සන්තිකෙ;** ඔබ වහන්සේ සමීපයෙහි, **උප්පන්නං;** උපන්නේ ය.

132. **නායක;** නායකයන් වහන්ස, **අස්මාහි;** අප විසින්, **මෙත්තචිත්තාහි;** මෛත්‍රී සිතින් යුක්තව, **පරිචිණ්ණා අසි;** පුරුදු කරන ලද්දේ වෙයි; **මහාමුනෙ;** මහාමුනීන්ද්‍රයන් වහන්ස, **සබ්බාසං;** (අප) සියල්ලන්ට ම, **පරිනිබ්බානාය;** පිරිනිවීම පිණිස, **අනුජානාහි;** අනුදන වදාරනු මැනවි.

133. **නිබ්බායිස්සාම ඉති;** පිරිනිවන් පාන්නෙමු යැයි, **එවං;** මෙසේ, **වදන්තියො;** කියන්නවුන්ට, **කිං වක්ඛාමි;** කුමක් කියන්නෙම් ද, **ජිනො;** බුදුන් වහන්සේ, **යස්ස;** යමක් සඳහා (අපේක්ෂා කරන), **ඉදානි;** දැන්, **වො;** තොපට **කාලං;** කාලයැයි, **මඤ්ඤථ;** හඟිවු, **ඉති;** යැයි; **අබ්‍රවී;** කී සේක.

134. **තදා;** එවිට, **තා ගොතමී ආදිකා;** ඒ ගෝතමී ආදි වූ, **තායො භික්ඛුනියො;** ඒ භික්ෂුණීහු, **ජිනං;** බුදුන් වහන්සේට, **වන්දිත්වා;** වැඳ, **තම්හා ආසනා;** එම අසුනෙන්, **උට්ඨාය;** නැඟිට, **අගමංසු;** ගියහ.

135. **සො වීරො;** ඒ වීර වූ, **ලොකග්ගනායකො;** ලොකාග්‍රනායකයන් වහන්සේ, **මහතා ජනකායෙන සහ;** මහජනසමූහයක් සමග, **යාව කොට්ඨකං;** දොර කොටුව තෙක්, **මාතුච්ඡං;** සුළුමව, **අනුසංයායී;** අනුව වැඩම කළ සේක.

136. **තදා;** එකල, **ගොතමී;** ගෝතමී තෙරණිය, **ඉතරාහි සබ්බාහි සහ;** සෙසු සියල්ලන් සමග, **පච්ඡිමං පාදවන්දනං;** අවසන් පා වැඳුම කෙරෙමින්, **ලොකබන්ධුනො පාදෙසු;** ලෝකබන්ධු වූ බුදුරදුන්ගේ පාමුල, **නිපති;** වැටුනා ය.

137. **ඉදං;** මෙය, **මය්හං;** මාගේ, **ලොකනාථස්ස;** ලෝකනාථයන් පිළිබඳ වූ, **පච්ඡිමකං;** අවසාන, **දස්සනං;** දැකීම යි, **අමතාකරං;** අමෘතයට ආකර වූ, **තව;** ඔබගේ, **මුඛං;** මුහුණ, **පුනො;** නැවත, **න පස්සාමි;** නො බලන්නෙමි.

138. **වීර;** වීරයන් වහන්ස, **තව;** ඔබ වහන්සේගේ, **සුකොමලෙ පාදෙ;** සියුමැලි පා, **වන්දනං;** (නැවත) වැඳීමත්, **මෙ;** මට, **න ච;** නැත්තේ ය, **ලොකග්ග;** ලෝකාග්‍රයන් වහන්ස, **සම්ඵුසිස්සාමි;** ඔබගේ පා ස්පර්ශ කරමි, **අජ්ජ;** අද, **නිබ්බුතිං;** නිවනට, **ගච්ඡාමි;** යමි.

139. **තව;** ඔබගේ, **යථාතථෙ ධම්මෙ;** යථා ස්වරූප ධර්මය, **දිට්ඨෙ;** දුටු කල්හි, **අනෙන රූපෙන;** මේ රූපයෙන්, **කිං;** කවර ප්‍රයෝජනයක් ද?, **එතං සබ්බං;** මේ සියල්ල, **සඞ්ඛතං එව;** හේතුප්‍රත්‍යයෙන් හටගත්තේම ය, **අනස්සාසිතං;** ආස්වාද රහිත ය, **ඉත්තරං;** බොහෝ කල් නොපවත්නේ ය.

140. **සා;** ඕ තොමෝ, **තාහි;** ඈලා සමග, **සකං භික්ඛුනිං උපස්සයං;** සිය මෙහෙණවරට, **ගන්ත්වාන;** ගොස්, **අඩ්ඪපල්ලඞ්කං ආභුජ්ජ;** අඩ පළඟක් බැඳ, **පරමාසනෙ;** උතුම් ආසනයෙහි, **නිසීදි;** හුන්නා  ය.

141. **තදා;** එකල, **බුද්ධසාසනවච්ඡලං;** බුද්ධශාසනයට ලැදි, **උපාසිකා;** උපාසිකාවෝ, **තස්සා;** ඇයගේ, **පවත්තිං සුත්වාන;** පුවත අසා, **පාදවන්දිකා;** පා වඳිනු කැමතිව, **තත්ථ;** එහි, **උපෙසුං;** එළඹුණහ.

142. **කරෙහි;** අත්වලින්, **උරං හනන්ත්වා;** පපුවට ගසා, **කරුණං රවං;** බැගෑපත් හඬින්, **රොදන්තා;** හඬමින්, **සොකට්ටා;** ශෝකයෙන් පෙළුණාහු, **ඡින්නමූලා;** මුල සිඳුණු, **ලතා යථා;** වැලක් මෙන්, **භූමිපාතිකා;** බිම වැටුණාහ.

143. **නො;** අපහට, **සරණදෙ නාථ;** සරණ දායක වූවන්ට පිහිට වූ උත්තමාවනි, **විහාය;** (අප) අත්හැර, **නිබ්බුතිං;** නිවනට, **මා ගමි;** නොයනු මැනවි, **මයං සබ්බායො;** අපි සියල්ලෝ ම, **සිරසා;** හිසින්, **නිපතිත්වාන;** වැටී, **යාචාම;** ඉල්ලවමු.

144. **තාසං;** ඔවුනතර, **යා;** යම්, **පධානතමා;** ප්‍රධානතම වූ, **සද්ධා;** සැදැහැති; **පඤ්ඤා;** නුවණැති, **උපාසිකා;** උපාසිකාවක් වූවා ද, **තස්සා;** ඈගේ, **සීසං;** හිස, **පමජ්ජන්තී;** පිරිමදිමින්, **ඉදං වචනං;** මේ වචනය, **අබ්‍රවී;** කීවා ය.

145. **පුත්තා;** දරුවනි, **මාරපාසානුවත්තිනා;** මාරබන්ධනය අනුව පවතින, **විසාදෙන;** ශෝකයෙන්, **අලං;** කම් නැත, **සඞ්ඛතං සබ්බං;** සංඛත ධර්ම සියල්ල, **අනිච්චං;** අනිත්‍ය ය, **වියොගන්තං;** වෙන්වීම කෙළවර කොට ඇත, **චලාචලං;** නිරන්තරයෙන් වෙනස්වන සුලු ය.

146. **තතො;** ඉක්බිති, **සා;** ඇ, **තා විස්සජ්ජිත්වා;** ඔවුන් පිටත් කොට යවා, **උත්තමං;** උතුම් වූ, **පඨමං ඣානං ච;** පළමු ධ්‍යානයට ද, **දුතියං;** ද්විතීය ධ්‍යානයට ද, **තතියං;** තෘතීය ධ්‍යානයට ද, **චතුත්ථං** ච අපි; චතුර්ථ ධ්‍යානයට ද, **සමාපජ්ජි;** සමවැදුණා ය.

147. **තථා;** එසේම, **ආකාසානඤ්චායතනං ච එව;** ආකාසානඤ්චායතනයට ද, **විඤ්ඤාණඤ්චායතනං;** විඤ්ඤාණඤ්චායතනයට ද, **ආකිඤ්චඤ්ඤං;** ආකිඤ්චඤ්ඤායතනයට ද, **නෙවසඤ්ඤං;** නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට ද, **යථාක්කමං;** පිළිවෙළින්, **සමාපජ්ජි;** සමවැදුණා ය.

148. **ගොතමී;** ගෝතමී තොමෝ, **යාවතා පඨමං ඣානං;** ප්‍රථමධ්‍යානය තෙක්, **පටිලොමෙන;** ප්‍රතිලෝම වශයෙන්, **සමාපජ්ජිත්ථ;** සමවැදුනාය, **තතො;** නැවත, **යාව චතුත්ථකං;** චතුර්ථධ්‍යානය තෙක් (අනුලෝම වශයෙන්), **සමාපජ්ජිත්ථ;** සමවැදුණා ය.

149. **තතො වුට්ඨාය;** එයින් නැගී සිට, **නිරාසනා;** තෙල් රහිත, **දීපච්චි විය;** පහන්සිලක් මෙන්, **පරිනිබ්බායී;** පිරිනිවුණා ය, **මහාභූමිචාලො;** මහත් භූමි චලනයක්, **ආසි;** වීය, **නභසා;** අහසින්, **විජ්ජුතා;** විදුලිධාරා, **පති;** වැටුණි.

150. **දුන්දුභියො;** (මේඝ ගර්ජනා නමැති) බෙරහඬ, **පනාදිතා;** නාද විය, **දෙවතා;** දෙවිවරු, **පරිදෙවිංසු;** වැළපුනහ, **ගගනා;** අහසින්, **මෙදිනං;** පොළවට, **පුප්ඵවුට්ඨී;** මල්වැසි, **අභිවස්සථ;** වැටුණේ ය.

151. **රඞ්ගමජ්ඣෙ;** රඟමඬලෙහි, **නටො යථා;** නළුවෙකු මෙන්, **මෙරුරාජා අපි;** මහාමේරු පර්වතය ද, **කම්පිතො;** කම්පා විය, **සොකෙන;** ශෝකයෙන්, **අතිදීනො ඉව;** අතිශයින් අසරණ වූවෙකු මෙන්, **සාගරො;** මහසයුර, **විරවො ආසි;** මහත් ඝෝෂා ඇති විය.

152. **තඞ්ඛණෙ;** එකෙනෙහි ම, **දෙවා ච;** දෙවියෝ ද, **නාගා ච;** නාගයෝ ද, **අසුරා ච;** අසුරයෝ ද, **බ්‍රහ්මා ච;** බ්‍රහ්මයෝ ද, **සංවිග්ග;** සංවේගයට පැමිණ, **ආහංසු;** මෙසේ කීහ, **යථා;** යම්සේ, **අයං;** මෝ, **විලයං;** නිවීමට, **යථා ගතා;** ගියාක් මෙන්, **වත;** ඒකාන්තයෙන්, **සඞ්ඛාරා;** සංස්කාරයෝ; **අනිච්චා;** අනිත්‍යයහ.

153. **යා සත්ථුසාසනකාරිකා;** යම් ඒ ශාස්තෲන් වහන්සේගේ අනුශාසනය කරන්නා වූ තෙරණිවරු, **ඉමං;** මැය, **පරිවාරිංසු;** පිරිවරා සිටියාහු ද, **තායො අපි;** ඇලා ද, **අනුපාදානා;** උපාදාන රහිතව, **දීපච්චි විය;** පහන්සිලක් මෙන්; **නිබ්බුතා;** පිරිනිවියාහ.

154. **හා;** අහෝ; **යොගා;** එක්වීම, **විප්පයොගන්තා;** වෙන්වීම අන්තකොට ඇත්තේ ය, **හා;** අහෝ, **සබ්බසඞ්ඛතං;** සියලු සංඛත ධර්ම, **අනිච්චං;** අනිත්‍ය ය, **හා;** අහෝ, **ජීවිතං;** ජීවිතය, **විනාසන්තං;** විනාශය කෙලවර කොට ඇත්තේ ය, **ඉති;** මෙසේ, **පරිදෙවනා;** වැළපීම, **ආසි;** විය.

155. **තතො;** ඉක්බිති, **දෙවා ච,** දෙවියෝ ද, **බ්‍රහමා ච;** බ්‍රහ්මයෝ ද, **ඉසිසත්තමං;** ඍෂි ශ්‍රේෂ්ඨ බුදුන් කරා, **උපෙච්චා;** එළඹ, **ලොකධම්මානුවත්තනං;** ලෝක ධර්මය අනුව කළයුතු දෑ, **කාලානුරූපං;** කාලානුරූපව, **කුබ්බන්ති;** කෙරෙති.

156. **තදා;** එවිට, **සත්ථා;** ශාස්තෘන් වහන්සේ, **සුතිසාගරං;** ශ්‍රැතිසාගර වූ (බොහෝ ඇසූ පිරූ තැන් ඇති), **ආනන්දං;** ආනන්ද තෙරුන්, **ආමන්තෙසි;** ඇමතූ සේක, **ආනන්ද;** ආනන්දය, **ගච්ඡ;** යන්න, **භික්ඛූනං;** භික්ෂූන්ට, **මාතුනිබ්බුතිං;** මවගේ පිරිනිවීම, **නිවෙදෙහි;** දන්වන්න.

157. **තදා;** එවිට, **නිරානන්දො;** සතුටින් තොර; **ආනන්දො;** ආනන්ද තෙරණුවෝ, **අස්සුනා;** කඳුළුවලින්, **පුණ්ණ ලොචනො;** පිරුණු ඇස් ඇතිව; "**භික්ඛවො;** මහණෙනි, **සමාගච්ඡන්තු**" **ඉති;** එක්රැස් වෙත්වා'යි, **ගග්ගදෙන සරෙන;** ගද්ගද (ගොත ගැසුණු) ස්වරයෙන්, **ආහ;** කීහ.

158. **පුබ්බ;** පෙරදිග, **දක්ඛිණ;** දකුණුදිග, **පච්ඡා;** පසුදිග, **උත්තරායං;** උතුරුදිග, **සුගතොරසා;** බුද්ධපුත්‍ර වූ, **යෙ භික්ඛවො;** යම් භික්ෂු කෙනෙක්; **වසන්ති;** වාසය කරත් නම්, **මය්හං;** මාගේ; **භාසිතං;** කීම, **සුණන්තු;** අසත්වා.

159. **යා;** යම් මවක්, **පයත්තන;** උත්සාහයෙන්, **මුනෙ;** බුදුන් වහන්සේගේ, **පච්ඡිමං සරීරං;** අන්තිම ශරීරය, **වඩ්ඪයී;** වර්ධනය කළා ද, **සා ගොතමී;** ඒ ගෝතමී තොමෝ, **සූරියොදයෙ;** හිරු උදාවීමේදී, **තාරාඉව;** තාරකා මෙන්, **සන්තිං;** නිවනට, **ගතා;** ගියා ය.

160. **පඤ්චනෙත්තො;** පසැස් ඇත්තාවූ, **නායකො අපි,** නායකයන් වහන්සේ පවා, **යත්ථ ගතා;** යම් තැනක ගිය (ඇයගේ), **ගතිං;** ගතිය, **න දක්ඛති;** නො දක්නා සේක් ද, **බුද්ධමාතා ඉති;** බුද්ධමාතා යන, **අසමං;** අසමවූ, **පඤ්ඤත්තිං;** ප්‍රඥප්තිය, **ඨපයිත්වා;** තබා, **ගතා;** (නිවනට) ගියා ය.

161. **සුගතෙ;** සුගතයන් වහන්සේ කෙරේ, **යස්ස;** යමෙකුගේ, **සද්ධා අත්ථි;** ශ්‍රද්ධාව ඇත් ද, **යො;** යමෙක්, **මහාමුනෙ;** මහාමුනීන්ද්‍රයන් වහන්සේ, **පියො;** ප්‍රිය කරයි ද, **සුගතොරසො;** ඒ බුද්ධපුත්‍ර තෙමේ, **බුද්ධමාතරි;** බුද්ධමාතාවට, **සක්කාරං;** සත්කාර, **කරොතු;** කරාවා.

162. **සුදූරට්ඨා අපි;** ඉතා දුර සිටියාවූ ද, **භික්ඛවො;** භික්ෂූහු, **තං සුත්වා;** ඒ අසා, **කෙචි බුද්ධානුභාවෙන ච;** සමහරු බුද්ධානුභාවයෙන් ද, **ඉද්ධීසු;** ඍද්ධීන්හි, **කොවිදා;** දක්ෂ වූ, **කෙචි;** සමහරු ද, **සීඝං;** වහා, **ආගච්ඡුං;** පැමිණියාහු ය.

163. **ගොතමී;** ගෝතමිය, **යත්ථ;** යම්තැනක, **සුත්තාසි;** සැතපී සිටියා ද, **මඤ්චකං;** ඒ ඇඳ, **සබ්බසොණ්ණමයෙ;** සියල්ල රනින් නිමවූ, **සුභෙ;** ශුභ වූ, **රමෙම;** රම්‍ය වූ, **කූටාගාරවරෙ;** උතුම් කුළුගෙයක, **ආරොපෙසුං;** තැබූහ.

164. **තෙ චත්තාරො ලොකපාලා;** ඒ සතරවරම් දෙවිවරු, **අංසෙහි;** දසරුවෙන්, **සමධාරයුං;** දැරූහ, **සෙසා;** සෙසු, **සක්කාදයො දෙවා;** ශක්‍රා දි දෙවිවරු, **කූටාගාරෙ;** කුළුගෙවල්, **සමග්ගයුං;** ගත්හ.

165. **සරදාදිච්චවණ්ණානි;** සරත්කාලයෙහි හිරු බඳු වර්ණ ඇති, **විස්සකම්මකතා;** විස්වකර්ම විසින් කරන ලද, **සබ්බානි;** සියලු, **පඤ්චසතානි කූටාගාරානි;** කුළුගෙවල් පනසියක්, **ආසුං;** විය.

166. **තා සබ්බා භික්ඛුනියො අපි;** ඒ සියලු භික්ෂුණීහු ද, **මඤ්චෙසු;** ඇඳන්වල, **සායිතා;** සයනය කරවන ලද්දෝ, **ආසුං;** වූහ, **දෙවානං;** දෙවියන්ගේ, **ඛන්ධං;** දසරුවට, **ආරූළ්හා;** නැඟුණාහු, **අනුපුබ්බසො;** අනුපිළිවෙළින්; **නිය්‍යන්ති;** ගෙනයති.

167. **නභත්ථලං;** අහස්තලය, **සබ්බසො;** හැම අයුරෙක් ම, **විතානෙන;** වියනින්, **ඡාදිතං;** වසනලද්දී, **ආසි;** විය, **සතාරා;** තරු සහිත, **චන්දසූරියා;** සඳහිරු, **කනකාමයා;** රන්මුවා ලෙස, **ලඤ්ඡිතා;** ලකුණු කරන ලද විය.

168. **නෙකා;** නොයෙක්, **පතාකා;** පතාකයෝ, **උස්සිතා;** ඔසවන ලද්දාහු ය, **පුප්ඵකඤ්චුකා;** පුෂ්පකඤ්චුකයෝ, **විතතා;** විසුරුවා හරින ලදහ, **ආකාසපදුමා;** අහස් පියුම්හු, **ඔගතා;** එල්ලුණහ, **මහියා;** පොළවෙන්, **පුප්ඵං;** මල්, **උග්ගතං;** පැන නැංගේ ය.

169. **චන්දසූරියා;** සඳහිරු, **දිස්සන්ති;** දක්නා ලැබේ, **තාරකා;** තරු, **පජ්ජලන්ති;** දිලෙයි, **ආදිච්චො;** හිරු, **මජ්ඣං ගතො අපි;** මධ්‍යගත වූ නමුත්, **සසී යථා;** සඳ මෙන්, **න තාපෙති;** (කිසිවෙකු) නොතවයි.

170. **දෙවා;** දෙවියෝ, **දිබ්බෙහි ගන්ධෙහි;** දිව්‍යමය සුවඳවලින් ද, **සුරභීහි;** මනා සුවඳවත්, **මාලෙහි ච;** මල්දමින් ද, **වාදිතෙහි ච;** වාදනයෙන් ද, **නච්චෙහි ච;** නැටුමෙන් ද, **සංගීතීහි ච;** මනා ගායනයෙන් ද, **පූජයුං;** පිදූහ.

171. **නාගා ච;** නාගයෝ ද, **අසුරා ච;** අසුරයෝ ද, **බ්‍රහ්මානො;** බ්‍රහ්මයෝ ද, **නිබ්බුතිං;** පිරිනිවී, **නීයන්තිං;** (සොහොන වෙත) ගෙනයනු ලබන, **බුද්ධමාතරං;** බුද්ධමාතාව, **යථාසත්ති;** ශක්ති පමණින්, **යථාබලං;** බල පමණින්, **පූජයිංසු;** පිදූහ.

172. **සුගතොරසා;** බුද්ධපුත්‍රී වූ, **නිබ්බුතා;** පිරිනිවියාවූ, **සබ්බායො;** සියලු තෙරණීහු, **පුරතො නීතා;** පෙරටු කොට ගෙනයන ලදහ, **බුද්ධපොසිතා;** බුදුන් හදා වැඩූ, **ගොතමී;** ගෝතමිය, **සක්කතා;** සත්කාර කරන ලදුව, **පච්ඡා;** පසුව, නීයතෙ; ගෙනයනු ලැබේ.

173. **ස නාගා අසුරා බ්‍රහ්මකා;** නාගයෝ ද අසුරයෝ ද බ්‍රහ්මයෝ ද සහිත, **දෙවමනුජා;** දෙව්මිනිස්සු, **පුරතො;** පෙරටුව ගමන් කළහ, **සසාවකො;** ශ්‍රාවකයන් සහිත, **බුද්ධො;** බුදුන් වහන්සේ, **මාතුයා;** මවට, **පූජනත්ථං;** පූජා කිරීම පිණිස, **පච්ඡා;** පසුව, **යාති;** වඩින සේක.

174. **යාදිසං;** යම්සේ, **ගොතමී පරිනිබ්බානං;** ගෝතමියගේ පරිනිර්වාණය, **අතිච්ඡරියං;** අතිශයින් ආශ්චර්යජනක වී ද, **බුද්ධස්ස;** බුදුරදුන්ගේ, **පරිනිබ්බානං;** පිරිනිවීම, **එදිසං;** එබඳු, **න ආසි;** නො වීය.

175. **බුද්ධො;** බුදුරජාණන් වහන්සේ, **බුද්ධස්ස;** බුදුරදුන්ගේ, **පරිනිබ්බානෙ;** පිරිනිවන් පෑමෙහි, **න උපදිස්සති;** දක්නට නො ලැබෙති, **ගොතමී පරිනිබ්බානෙ;** ගෝතමියගේ පරිනිර්වාණයෙහි, **බුද්ධො;** බුදුහු ද, **තථා;** එසේ ම, **සාරිපුත්තාදිකා;** සැරියුත් ආදි, **භික්ඛවො;** භික්ෂූහු ද දක්නට ලැබේ.

176. **තෙ;** ඔවුහු, **ගන්ධචුණ්ණෙ;** සුවඳසුණු, **අවකිණ්ණානි;** බහාලූ, **සබ්බගන්ධමයානි;** සියලු සුවඳ දැයින් යුතු, **චිතකානි;** සෑයන්, **කරිත්වාන;** කරවා, **තා;** ඒ තෙරණීන්, **තහිං;** එහි, **ඣාපයිංසු;** දැවූහ.

177. **අට්ඨිසෙසානි;** අස්ථිධාතු සෙස කොට ඇති, **සෙසභාගානි;** සෙසු කොටස්, **සබ්බසො;** සියලු ආකාරයෙන්, **ඩයිහිංසු;** දැවුණාහ, **තදා;** එවිට, **ආනන්දො ච;** ආනන්ද තෙරණුවෝ ද, **සංවෙගජනනං;** සංවේගය උපදවන, **වචො;** වචන, **අවොච;** කීහ.

178. **ගොතමී;** ගෝතමිය, **නිධනං;** නිවනට, **යාතා;** ගියා ය, **අස්සා;** ඇයගේ, **සරීරකං ච;** ශරීරය ද, **දඩ්ඪං;** දැවුණි, **බුද්ධනිබ්බානං;** බුදුරදුන්ගේ පරිනිර්වාණය, **න චිරෙන;** නොබෝ දිනකින්, **භවිස්සති;** වන්නේ යැයි, **අහං;** මම, **සඞ්කෙ;** සැක කරමි.

179. **තතො;** ඉක්බිති, **බුද්ධචොදිතො;** බුදුන් විසින් මෙහෙයවනු ලැබූ, **ආනන්දො;** ඒ ආනන්ද තෙර, **ගොතමීධාතූනි,** ගෝතමී තෙරණියගේ අස්ථිධාතු, **තස්සා;** ඇයගේ, **පත්තගතානි;** පාත්‍රගත කොට, **නාථස්ස;** බුදුරදුන්ට, **උපනාමෙසි;** පිළිගැන්වීය.

180. **ඉසිසත්තමො;** ඍෂි ශ්‍රේෂ්ඨයන් වහන්සේ, **තානි;** ඒවා, **පාණිනා;** අතින්, **පග්ගය්හ;** ගෙන, **අවොච;** වදාළ සේක, **යථා;** යම්සේ, **තිට්ඨතො;** පිහිටි, **සාරවන්තස්ස;** අරටුව ඇති, **මහතො රුක්ඛස්ස;** මහත් ගසක,

181. **යො සො;** යම් ඒ, **මහන්තතරො ඛන්ධො;** විශාල වූ කඳ, **අනිච්චතා;** අනිත්‍යතාව නිසා, **පලුජ්ජෙය්‍ය;** වැනසී යේ ද, **තථා;** එසේ, **භික්ඛුනීසඞ්ඝස්ස;** භික්ෂුණී සංඝයාගේ මහත් කඳ වූ, **ගොතමී;** ගෝතමිය, **පරිනිබ්බුතා;** පිරිනිවියා ය.

182. **අහො;** අහෝ, **අච්ඡරියං;** ආශ්චර්යකි, **සරීරමත්තසෙසාය;** සිරුර පමණක් ඉතිරි කොට, **මාතුයා පරිනිබ්බුතාය අපි;** මව පිරිනිවි කල්හිදු, **මය්හං;** මට, **සොකපරිදෙවො;** ශෝකයක් හෝ වැළපීමක්, **නත්ථි;** නැත.

183. **තිණ්ණසංසාරසාගරා;** තරණය කළ සයුර ඇති, **පරිවජ්ජිතසන්තාපා;** දුරුකළ සන්තාප ඇති, **සීතිභූතා;** සිහිල් වූ, **සුනිබ්බුතා;** මොනොවට නිවුණ, **සා;** ඇය (ගැන), **පරෙසං;** අනුන් විසින්, **න සොචියා;** ශෝක කටයුතු නොවෙයි.

184. **භික්ඛවො;** මහණෙනි, **සා පණ්ඩිතාසි;** ඕ පණ්ඩිතය, **මහාපඤ්ඤා;** මහාප්‍රාඥය, **පුථුපඤ්ඤා;** පුථුප්‍රාඥය (පැතිරුණු නුවණැත්තියකි), **තථා එව;** එසේ ම, **භික්ඛුනීනං;** භික්ෂුනීන් අතර, **රත්තඤ්ඤූ;** චිරරාත්‍රඥය, **එවං;** මෙසේ, **ධාරෙථ;** දරවු.

185. **ගොතමී;** ගොතමිය, **ඉද්ධියා;** සෘද්ධියෙහි, **වසී ආසි;** වශී වූවාය, **දිබ්බාය සොතධාතුයා ච;** දිව්‍යකණෙහි ද, **චෙතොපරියඤාණස්ස ච;** පරසිත් දන්නා නුවණෙහි ද, **වසී ආසි;** වශී වූවා ය.

186. **පුබ්බෙනිවාසං;** පෙරවිසූ කඳපිළිවෙළ, **අඤ්ඤාසි;** දැන සිටියා ය, **දිබ්බචක්ඛු;** දිවැස, **විසොධිතං;** පිරිසිදු කරන ලදී, **සබ්බාසවපරික්ඛීණා;** සියලු ආශ්‍රව ගෙවී ගියා ය, **තස්සා;** ඇයට, **පුනබ්භවො;** පුනර්භවයක්, **නත්ථි;** නැත.

187. **අත්ථධම්මනිරුත්තීසු;** අර්ථ ධර්ම නිරුක්තියෙහි ද, **තථා එව;** එසේම, **පටිභානෙ;** ප්‍රතිභානයෙහි ද, **ඤාණං;** ඥානය, **පරිසුද්ධං;** පිරිසිදු ය, **තස්මා;** එනිසා, **සා;** ඕ තොමෝ, **න සොචනීයා;** ශෝක කළයුත්තී නොවෙයි.

188. **අයොඝනහතස්ස;** කුළුගෙඩියෙන් ගසා; **අනුපුබ්බ;** පිළිවෙළින්, **උපසන්තස්ස;** නිවණු, **ජලතො;** දිලිසෙන, **ජාතවෙදසො;** ගින්නේ **ගතිං;** ගිය තැන හෙවත් ගතිය; **යථා න ඤායතෙ;** දැනගත නො හැක්කේ යම්සේ ද?

189. **එවං;** මෙසේ, සම්මා **විමුත්තානං;** මෙනොවට මිදුණු, **කාමබන්ධොඝතාරිනං;** කාමබැඳුම් නමැති ඕඝ තරණය කළ, **අචලං පදං;** නිර්වාණපදයට, **පත්තානං;** පැමිණියවුන්ට (රහතුන්), **පඤ්ඤාපෙතුං;** පණවන්නට; **ගති;** ගතියක්, **නත්ථි;** නැත.

190. **තතො;** එහෙයින්, **අත්තදීපා හොථ;** තමා පිහිට කොට වසවු, **සතිපට්ඨානගොචරා;** සතිපට්ඨානය විෂය කොට වසවු, **සත්තබොජ්ඣඞ්ගෙ;** බෝධ්‍යංගධර්ම හත, **භාවෙත්වා;** වඩා, **දුක්ඛස්ස;** දුක, **අන්තං කරිස්සථ;** කෙළවර කරවු.

**ඉත්ථං** සුදං; මේ ආකාරයට, **මහාප්‍රජාපතී ගෝතමී;** මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය, **ඉමා ගාථායො** මේ ගාථා **අභාසිත්ථ ඉති;** ප්‍රකාශ කළාය.